# මධ්‍යම පරිසර අධිකාරිය
## மத்திய சுற்றாடல் அதிகாரசபை
## Central Environmental Authority

පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web: www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. CEA/06/EPU/PC&PR/09/2024  ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref.  දිනය / திகதி / Date 2024.11.06

## මාධ්‍ය නිවේදනය

### <u>මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල 8ක් ද</u>

### <u>ISO 9001:2015 ප්‍රමිති සහතිකය ලබාගනී..</u>

මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල 8ක් ද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ලබාදෙන ISO 9001:2015 ලබා ගැනීමට සමත් විය. ඒ අනුව, මධ්‍යම පරිසර අධිකාරියේ උතුරු, නැගෙනහිර, උතුරු මැද, මධ්‍යම, සබරගමුව, ඌව, දකුණු සහ වයඹ යන පළාත් කාර්යාල මෙලෙස ISO 9001:2015 ප්‍රමිති සහතිකය හිමිකර ගැනීමට සමත්ව තිබේ. මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සහ බස්නාහිර පළාත් කාර්යාලය 2023 වර්ෂයේ දී ISO 9001:2015 ලබා ගැනීමට කටයුතු කර ඇත. මධ්‍යම පරිසර අධිකාරියේ කාර්යයන් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතිය මත පදනම් වූ "තත්ත්ව කළමනාකරණ පද්ධතියක්" ක්‍රියාත්මක කිරීම මගින් මෙලෙස ISO 9001:2015 ප්‍රමිති සහතිකය ලබා ගැනීමට මධ්‍යම පරිසර අධිකාරියට හැකි විය.

ඒ අනුව, මේ වන විට මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සහ පළාත් කාර්යාල නවයෙහි ම ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු මෙම "තත්ත්ව කළමනාකරණ පද්ධතිය" ක්‍රියාත්මක වේ. මෙමගින් මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර සැලසුම්කරණය, පරිසර දූෂණ පාලනය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, රසායනික හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය, වායු තත්ත්ව සහ රසායනාගාර සේවා, පාරිසරික බලපෑම් තක්සේරුව, ස්වාභාවික සම්පත් කළමනාකරණය, පර්යේෂණ සහ සංවර්ධන, උපාය මාර්ගික පාරිසරික ඇගයීම් ඇතුළු මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සහ පළාත් කාර්යාලය මගින් සපයනු ලබන සියලු ම සේවාවන් තක්සේරු කිරීම, පාරිසරික අධ්‍යාපනය සහ දැනුම්වත් කිරීම, තොරතුරු බෙදා හැරීම, පාරිසරික ප්‍රවර්ධනය, නීතිය ක්‍රියාත්මක කිරීම, මහජන පැමිණිලි විසඳීම, තනි භාවිත ප්ලාස්ටික් පාලනය, අනුකූලතා අධීක්ෂණය සහ ඒහා සබැඳි කාර්යයන් වෙත මෙම ක්‍රියාවලියේ දී අවධානය යොමු කරයි.

ආයතනයේ සමස්ත කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සහ එමගින් තිරසර සංවර්ධන ඉලක්ක වෙත ගමන් කිරීමේ මාවත ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් අධ්‍යක්ෂ ජනරාල් පී. බී. හේමන්ත ජයසිංහ මහතාගේ සංකල්පයක් මත මධ්‍යම පරිසර අධිකාරිය "තත්ත්ව කළමනාකරණ පද්ධතිය" ස්ථාපිත කරන ලදී. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන මත කටයුතු කරන මධ්‍යම පරිසර අධිකාරිය අදාළ රෙගුලාසි, තාක්ෂණික මාර්ගෝපදේශ සහ අභ්‍යන්තර චක්‍රලේඛ මගින් පාලනය වන අතර මෙම කටයුතු තවදුරටත් ශක්තිමත්ව සිදු කරමින් ආයතනික වශයෙන් සේවාලාභීන් වෙත තෘප්තිමත් සේවාවක් සැපයීම සහ ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණ කාර්යය තවදුරටත් ශක්තිමත් කිරීම මෙම ක්‍රියාවලියේ ප්‍රධානතම අපේක්ෂාවන් වේ.

මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල 8 සඳහා ISO 9001:2015 ප්‍රමිති සහතිකය ලබාගත් බව පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි හ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් නීතිඥ ප්‍රභාත්

චන්ද්‍රකීර්ති මහතා වෙත පසුගිය දා (04) මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිල වශයෙන් දැනුම් දෙන ලදී. එම අවස්ථාවට පරිසර අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියන් වන පද්මා අබේකෝන් මහත්මිය, පී. කේ. එස්. සුභෝද්නී ඇතුළු නිලධාරීහු මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් පී. බී. හේමන්ත ජයසිංහ මහතා, මධ්‍යම පරිසර අධිකාර්යේ "තත්ත්ව කළමනාකරණ පද්ධතිය" ද භාරව කටයුතු කරන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර කළමනාකරණ හා ඇගයීම්) එන්. එස්. ගමගේ මහතා ඇතුළු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරු සහ නිලධාරීහු සහභාගී වූහ.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

පී. බී. හේමන්ත ජයසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම පරිසර අධිකාරිය